**ශීර්ෂය 07 - අධිකරණ සේවා කොමිෂන් සභාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිළධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වෙනුවෙන් වැය කල මුදල රු.3,187,258 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ (ඒසීඒ-සී ආකෘතියේ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ රු.2,976,258 ක් ලෙස දැක්වීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.211,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අදාල වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව සටහන් කළ යුතුවීම. | 2020 වර්ෂයේ සිට නිවැරදි කරමි. |

**1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 104 (3) සහ 104 (4) | වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ලබාගෙන නොතිබූ අතර පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට මාස 05 ක සහ මාස 06 ක කාලයක් ප්‍රමාද වී තිබුණි. | මුදල් රෙගුලාසි 104 (3) සහ (4) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මෙම අනතුරුවලට අදාලව ප්‍රාරම්භක වාර්තාවක් අප විසින් ඉදිරිපත් කර නොමැත. මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාර වාර්තාව ඉදිරිපත් කිරීමට මාස 05, 06 ක කාල පරාසයක් ගතවී ඇත. මින් ඉදිරියට අනතුරක් සිදු වූ අවස්ථාවකදී කඩිනමින් එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත සමඟ දෛනික ධාවන සටහන්, විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 2020 වර්ෂයේ සිට විගණකාධිපති වෙත යැවීමට කටයුතු සිදු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03.1 ඡේදය | කොමිෂන් සභාව සතු වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | අංක KR - 5692 හා අංක KX – 6732 දරන වාහන සඳහාත් අධිකරණ අමාත්‍යාංශය මඟින් පවරා ඇති KR – 2383 දරන මෝටර් රථය හා KR – 2435 දරන මෝටර් රථය සඳහාත් ඉන්ධන පරීක්ෂාවන් ඉදිරියේදී නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 වියදම් කළමනාකරණය
--------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------------ | නිර්දේශය<br>------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------------- |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 03 කට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.780,000 ක් වූ අතර, එම වැය විෂයන් වලට අදාල මුළු වියදම රු. 113,396 ක් වූයෙන් රු. 666,604 ක් වූ ශුද්ධ ඉතිරිවීම්, ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 74 සිට සියයට 95 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. තවද එක් ප්‍රාග්ධන වැය විෂයක ශුද්ධ ප්‍රතිපාදනය රු.2,000,000 ක් වූ අතර එම වැය විෂයට අදාල මුළු වියදම රු.5,920 ක් වීමෙන් ඉතිරිය වූ රු.1,994,080 ක වටිනාකම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 99 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තුව පිළියෙළ කළ යුතුවීම. | දේශිය ගමන් වියදම් සීමා කිරීම, නිල ඇඳුම් හිමි නිලධාරීන් අඩු වීම, තාවකාලික ගොඩනැගිල්ලක ආයතනය පවත්වාගෙන යන බැවින් අත්‍යවශ්‍ය නඩත්තු පමණක් සිදු කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම ප්‍රමාද වීම යන කරුණු ඉතිරිවීම් සඳහා හේතු විය. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 වන විට වසර 02 කට වැඩි කාලයක සිට එක් නිලධාරියකුගෙන් අයවිය යුතු රු.185,000 ක ණය ශේෂයක් පැවතුණි. | හිඟ ණය ශේෂය නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම | සේවය අතහැර ගිය නිලධාරියා වෙත එම මුදල ගෙවීමට කටයුතු කරන මෙන් දැනුවත් කල අතර පිළිතුරක් නොලද බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 (ඉ) හි කල්ගත වූ ණය ශේෂ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 (5.6) ඡේදයේ විධිවිධාන අනුව ලංසු සඳහා ආරාධනා කිරීමේ දී පිළියෙල කරන ලද ලංසු ආරාධනා ලියවිල්ලේ මිල දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ වල පිරිවිතර නිශ්චිතවම දැක්විය යුතු වුවත් 2019 ජූලි 19 දින ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලංසු ලේඛන වල මිල දී ගැනීමට අපේක්ෂා කරන වායු සමීකරණවල මාදිලිය නිශ්චිතව නොදක්වා 2019 ජූලි 30 දින ෆැක්ස් පණිවුඩයක් මගින් අවශ්‍ය මාදිලිය ලංසුකරුවන් වෙත දන්වා යවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 (5.6) ඡේදයේ විධිවිධාන අනුව මිල දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ වල පිරිවිතර නිශ්චිතවම දැක්විය යුතුවීම. | මින් ඉදිරියට එබඳු දෝෂ ඇති නොවන ආකාරයෙන් කටයුතු කිරීමට වග බලා ගනිමි. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කොමිෂන් සභාව සතු යතුරු පැදියක් සහ මෝටර් රථයක් වසර 03 ½ ක සහ වසර 02 ක කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | අළුත්වැඩියා කළහැකි තත්ත්වයේ පවතින වාහන අළුත්වැඩියා කර ධාවනයේ යෙදවීමටත් අපහරණය කළයුතු තත්ත්වයේ පවතින වාහන අදාල ක්‍රමවේදයට අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුවීම. | WPJX – 0875 දරන SUZUKI HJ 125 K යතුරු පැදිය කාර්මික විද්‍යාලය වෙත ලබා දීමට පෙර සදාකාලික අපහරණය කළයුතු වේ.එම කටයුතු සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුවේ සුදුසු පරීක්ෂකවරයෙකු සහභාගී කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br>WPKJ – 5005 දරන Jaguar X – Type Classic<br>කාර් රථයට අදාල තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට මෝටර් රථ පරීක්ෂකවරයෙකු ගෙන්වා ගැනීමට කීප අවස්ථාවකදීම අවශ්‍ය කටයුතු සිදු කලද ගෙන්වා ගැනීමට නොහැකි වී ඇත. 2020 ජනවාරි 27 දිනැති ලිපිය මඟින් නිලධාරියෙකු ගෙන්වා ගැනීමට තවදුරටත් කටයුතු කර ඇත. |
| (ආ) අධිකරණ සේවා කොමිෂන් සහා ලේකම් කාර්යාල පරිශ්‍රය පිහිටි හෙක්ටයාර් 0.0959 ක ඉඩම් කොටසේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම පවරා දීමට අදාල නිර්දේශය පළාත් ඉඩම් කොමසාරිස් වෙත 2020 පෙබරවාරි 24 දිනැති ලිපිය මඟින් ලබාදී ඇත. ඒ අනුව අදාල කටයුතු සිදු කරමින් පවතී. |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සිදු වී තිබූ වාහන අනතුරු 02 ක් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන (i) හි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි වර්ෂය තුල අලාභ අයකර ගැනීම්/ කපා හැරීම්/අත්හැරීම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | වාහන අනතුරුවලට අදාල තොරතුරු සටහන (i) හි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි සටහන් කළ යුතුවීම. | 2020 වර්ෂයේ සිට නිවැරදි කරමි. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව රාජ්‍ය ආයතන තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ චක්‍රලේඛයේ සඳහන් අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතුවීම. | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ප්‍රකාරව 2020 වර්ෂය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **නිර්දේශය**<br>------------- | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>---------------------------------- |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට සමස්ථ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 71 ක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 60 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවීම. | එම පුරප්පාඩු 71 න් 17 ක් අධිකරණ නිලධරයන්ගෙන් හා උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවට අයත් නිලධාරීන්ගෙන් පූරණය කර ගනිමින් රාජකාරී ඉටු කර ගැනීමට කටයුතු කර ඇති අතර එක් තනතුරක පුරප්පාඩුව කොන්ත්‍රාත් පදනම මත පත් කළ නිලධාරීවරයෙකුගෙන් ආවරණය කර ඇත. |
| (ආ) කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්ම වූ තථ්‍ය සේවක සංඛ්‍යාව 18 ක් විය. | අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා නිලධාරීන් 05 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | අවශ්‍යතාවය අනුව තනතුරු අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුවීම. | සහකාර ලේකම් තනතුරු 04 හි රාජකාරි කටයුතු අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන්ගෙන් පූර්ණය කර ගැනීමට කටයුතු කර ඇත. |